# සාමාජිකත්ව කොන්දේසි

- සෑම දෙයකම පාහේ ඉල්ලා ගැනීමේ කාලය දින 28 කි. දින 14 කට සීමාවූ බොහෝ බහු මාධ්‍ය මීට ඇතුලත් වන්නේ නැත. පවතින ඉල්ලා ගැනීමේ සීමාවන් සඳහා ආයුබෝවන් ප්‍රචාරක පත්‍රිකාව බලන්න.
- වෙනත් පුස්තකාල සාමාජිකයකු වෙන් කරවා ගෙන නොමැති නම් දෙවරක් අලුත් කර ගත හැක. අලුත් කිරීම් පුද්ගලිකව පැමිණ හෝ දුරකථනය මගින් හෝ අන්තර් ජාලය මගින් කරවා ගත හැක.
- පුස්තකාල ද්‍රව්‍ය ලබා ගැනීමේදී පුස්තකාල කාඩ් පතක් ඉදිරිපත් කල යුතුම වේ. ව්‍යතිරේකයක් වශයෙන් නම සහ ලිපිනය සඳහන් විධිමත් හඳුනාගැනීමේ පිළිවෙලක් ඉදිරිපත් කළ යුතුය.
- නම සහ ලිපිනයේ වෙනසක් ඇතිවූ වහාම මොනෑස් පොදු පුස්තකාල සේවයට දැනුම්දිය යුතුය.
- 2000 පුද්ගලික තොරතුරු ලබා ගැනීමේ පනත යටතේ විධිමත් හඳුනාගැනීමේ පිළිවෙතක් ඉදිරිපත් කර තමාගේ පුස්තකාල ද්‍රව්‍ය ඉල්ලා ගැනීමේ තොරතුරු අඩංගු ලේඛනය පරීක්ෂා කර බැලීම සඳහා කාර්යාළ නිළධාරියකු ගෙන් ඉල්ලා සිටිය හැක.
- නියමිත දිනය පසුවී ද්‍රව්‍ය බාරදෙන සාමාජිකයන් හට අතපසුවීමේ ගාස්තුවක් ගෙවීමට සිද්දවණු ලැබේ.
- ඉල්ලා ගත් ද්‍රව්‍ය වලට සිදුවී ඇති අලාභ වෙතොත් ඒවා ආපසු බාරදෙන අවස්ථා වේදී පුස්තකාල කාර්ය මංඩලයට වාර්තා කළ යුතුය. බාරකරු විසින් හෝ කාඩ් පත හිමි අය විසින් අලාභය ගෙවිය යුතුය. අය කිරීම ද්‍රව්‍ය වල පිරිවැය සහ ආපසු නොගෙවන සකස් හිරීමේ ගාස්තුවක්ද වේ.
- ලබා ගත් ද්‍රව්‍ය පුස්තකාලයෙන් ඉවතට ගෙන යෑමට පෙර දැකිය හැකි අලාභ කාර්ය මංඩලයට වාර්තා කළ යුතුය.
- සෑම සාමාජිකයකුටම එක් සාමාජික කාඩ් පතක් ලබා ගැනීමට හිමිකම් තිබේ. අවතැන්වූ හෝ සොරකම් කර ඇති කාඩ් පත් සම්බන්ධයෙන් වහාම පුස්තකාලයට දැනුම්දිය යුතුය. ආපසු කිකුත් කරණු ලබන කාඩ් පතට ගාස්තුවක් අය කරණු ලැබේ.
- පූර්ණ සාමාජික කොන්දේසි (මොනෑස් පොදු පුස්තකාල ප්‍රාදේශීය නීති අංක 3) පිටපතක් ලබා ගැනීම සඳහා පුස්තකාල කාර්ය මංඩලයෙන් විමසන්න.